Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

81 | S | I

Grade 10 – First Term Test – July 2023

කාලය : පැය 1
Time: 1 hour

පළමු වාර පරීක්ෂණය - 2023 ජූලි - 10 ශ්‍රේණිය

කෘෂි හා ආහාර තාක්ෂණය - I

Name: ..... Class: ..... Index no: .....

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අඟන් ගඟෙන් පෝෂණය වන වැව් වන්නේ,
(1) මින්නේරි, කන්තලේ වැව
(2) නුවර, කලා වැව
(3) යෝධ වැව, තිස්ස වැව
(4) ගිරිතලේ වැව, කන්තලේ වැව

යැපුම් කෘෂිකර්මාන්තයේ ප්‍රධානම ලක්ෂණ වන්නේ,
(1) ඒක බෝග වගාවක් පවත්වාගෙන යාම.
(2) එදිනෙදා පරිභෝජනය සඳහා ආහාර, ඇඳුම්, ඖෂධ වැනි දෑ
(3) ලාබ ලබා ගැනීමේ අරමුණෙන් බෝග වගාකිරීම.
(4) මහා පරිමාණ වගා බිම් ලෙස පවත්වාගෙන යාම.

රජරට ප්‍රදේශයේ මීට වසර කිපයකට පෙර සාදා නිම කළ ජලාශය වන්නේ,
(1) වික්ටෝරියා ජලාශය
(2) මොරගහකන්ද ජලාශය
(3) සමනල වැව
(4) කවුඩුල්ල ජලාශය

සුළඟේ දිසාව මැනීමට භාවිත කරන උපකරණය කුමක්ද ?
(1) සුළං දිශා දර්ශකය
(2) සූර්ය දීප්තමානය
(3) අනිලමානය
(4) ආර්ද්‍රතාමානය

විශ්කම්භය අනුව පාංශු බනිජයක් නොවන්නේ,
(1) වැලි (2) වැටි (3) රොන්මඩ (4) බොරළු

පාංශු ජීවීන් මගින් අහිතකර බලපෑමක් නොවන්නේ,
(1) ශාක වලට පළිබෝධ ලෙස ක්‍රියා කරයි.
(2) පසේ පෝෂක ඉවත්කිරීම සිදුකරයි.
(3) කාබනික ද්‍රව්‍ය වියෝජනය කිරීම.
(4) ශාක වලට රෝග බෝ කරයි.

හුණුගල් හා ඩොලමයිට් විපරිත වීමෙන් සෑදෙන පාෂාණ වර්ග කුමක්ද ?
(1) කිරිගරුඬ (2) ක්වාට්ස් (3) නයිස් (4) ගල්වැලි

අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) වැඩි උෂ්ණත්වයේ දී පුෂ්ප හා පරාග වියලීයාම.
(2) උෂ්ණත්වය වැඩිවන විට යම් කාලසීමාවක් දක්වා ප්‍රභාසංස්ලේෂණය වැඩිවේ.
(3) වැඩි උෂ්ණත්වයේදී ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය වැඩිවේ.
(4) උත්ස්වේදනය අඩුවීමෙන් ශාකය මැලවී යයි.

09. අතීතයේ දී වැව වල ජලය මගින් වැව් බැම්මට ඇතිවන පීඩනය පාලනය කිරීමට භාවිතා කළ ඉදිකිරීම් නිර්මාණය පහත ඒවායින් කවරක්ද ?
(1) බිසෝ කොටුව (2) රළපනාව (3) සොරොව්ව (4) පිටවාත

10. දේශගුණික කලාප කෘෂි පාරිසරික කලාපවලට බෙදීමේදී පදනම් වී ඇත්තේ,
(1) භූ විෂමතාව, පස් වර්ගය, භූමි භාවිතය (2) උෂ්ණත්වය, වාර්ෂික වර්ෂාපතනය, පස
(3) සූර්යාලෝකය, පස, උච්චත්වය (4) උච්චත්වය, වාර්ෂික වර්ෂාව, පස

11. උදාසීන ගෘකවල මල් හට ගැනීම කෙරෙහි බලපාන්නේ,
(1) කෙටි දහවල බලපායි. (2) දිගු දහවල බලපායි.
(3) දවල් කාලයේ දිගු බලනොපායි. (4) කෙටි හා දිගු දහවල බලපායි.

12. කෘෂිකාර්මික කටයුතු සඳහා වායුගෝලීය උෂ්ණත්වය මනිනු ලබන්නේ පොළවේ සිට කොපමණ උසකින්ද ?
(1) 1.5 මීටර් (2) මීටර් 1.2 (3) මීටර් 2.0 (4) මීටර් 1.0

13. ආලෝකය පවතින් කාලසීමාව මැනීමට භාවිතා කරන්නේ පහත කවර උපකරණයද ?
(1) අනිලමානය (2) සූර්ය විකිරණමානය
(3) සූර්ය දීප්තමානය (4) තෙත් හා වියළි උෂ්ණත්වමානය

14. ඊසාන දිග මෝසම සුළං මගින් ලැබෙන වර්ෂාව ශ්‍රී ලංකාවට ලැබෙන්නේ කවර මාස වලද ?
(1) නොවැම්බර් - පෙබරවාරි මාසවල (2) මැයි - පෙබරවාරි මාසවල
(3) මාර්තු - සැප්තැම්බර් මාසවල (4) ඔක්තෝබර් - නොවැම්බර් මාසවල

15. පාෂාණවලින් මාතෘ ද්‍රව්‍ය සෑදීමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ,
(1) පාංශු ජීර්ණය (2) පාංශු ජනනය
(3) පාංශු වයනය (4) පාංශු ව්‍යුහය

16. ආග්නේය පාෂාණයක් වන්නේ පහත ඒවායින් කවරක්ද ?
(1) වැලිගල් (2) කිරිගරුඬ (3) ෂෙල් (4) ක්වාට්ස්

17. තෙත් කලාපයේ වැඩිපුරම දක්නට ඇති පස් කාණ්ඩය වන්නේ,
(1) රතු දුඹුරු පස (2) රතු දුඹුරු හා දියළු පස
(3) රතු කහ පොඩ්සොලික් පස (4) දියළු පස

18. එක වැවකින් පෝෂණ වන ප්‍රදේශය ඊළඟ වැවේ පෝෂක ප්‍රදේශ ලෙස පවත්වාගෙන යාම හඳුන්වා ලබන්නේ,
(1) බිසෝකොටුව (2) දියකැට පහන
(3) එල්ලගා පද්ධතිය (4) සළපනාව

19. පාංශු පැතිකඩෙහි විශෝධන කලාප ලෙස හඳුන්වන්නේ කවර කලාපද ?
(1) A (2) B (3) C (4) R

20. ගෘකවලට ලබා ගත හැකි පාංශු ජලය පවතින ආකාරය කුමක්ද ?
(1) ගුරුත්වාකර්ෂණ ජලය (2) කේෂාකර්ෂණ ජලය
(3) ජලාකර්ෂණ ජලය (4) කේෂාකර්ෂණ හා ජලාකර්ෂණ ජලය

21. පාංශු වාතයේ වැදගත්කමක් නොවන්නේ,
(1) පාංශු ජනනයට උපකාරී නොවීම.
(2) කාබනික් ද්‍රව්‍ය වියෝජනයට උපකාරී වීම.
(3) පාංශු ජීවීන්ට උපකාරී වීම.
(4) බීජ ප්‍රරෝහණයට ගෘක මූල්වල ශ්වසනයට උපකාරී වීම.

ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප සංඛ්‍යාව වන්නේ,
(1) 3 කි. (2) 5 කි. 63) 7 කි. (4) 9 කි.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කළ බහුකාර්යය යෝජනා ක්‍රමය නම්,
(1) උඩවලව යෝජනා ක්‍රමය (2) නිල්වලා යෝජනා ක්‍රමය
(3) ලූණුගම්වෙහෙර යෝජනා ක්‍රමය (4) ගල්ඔය යෝජනා ක්‍රමය

පාංශු පැනිකඩක කාබනික ද්‍රව්‍ය බහුලව පවතින්නේ,
(1) මාතෘ ද්‍රව්‍ය කලාපයේ. (2) විශෝධන කලාපයේ.
(3) සංචාංක කලාපයේ. (4) මාතෘ පාෂාණ කලාපයේය.

සරල වර්ෂා මානයට සාපේක්ෂව ස්වයංක්‍රිය වර්ෂා මානය භාවිතයෙන් ලැබෙන ප්‍රයෝජනය වන්නේ,
(1) වර්ෂාපතන හා සාපේක්ෂ ආර්ද්‍රතාවය ද දැනගත හැකි වීම.
(2) වර්ෂාපතන හා වාෂ්පීකරණ ප්‍රමාණය ද දැනගත හැකි වීම.
(3) වර්ෂාව පැවති ස්ථානය දැන ගැනීමට හැකි වන නිසා.
(4) යම් දිනයක් තුළ වර්ෂාව පැවති කාල සීමාව දැන ගැනීම.

තෙත් කලාපීය ප්‍රදේශවල බහුලව දැකිය හැකි ආම්ලික පස් කාණ්ඩය කුමක්ද ?
(1) දුඹුරු ලෝම පස (2) රතු දුඹුරු පස
(3) දියළු පස (4) රතු කහ පොඩ්සොලික් පස

පස සෑදීමේ පළමු පියවර පාෂාණය ජීර්ණයයි. පාෂාණ ජීර්ණය කෙරෙහි බලපෑමක් ඇති නොකරන සාධකයක් වනුයේ,
(1) ආලෝකයේ බලපෑම (2) උෂ්ණත්වයේ වෙනස්වීම
(3) ගලා යන ජලය (4) මිනිස් හා සත්ව ක්‍රියාකාරකම්

යම් රටක යම් කාල පරිච්ඡේදයක් තුලදී නිපදවන ලබන සේවාවල අගය හඳුන්වන්නේ,
(1) ක්ෂණික ආහාර වර්ග සුලභ වීම. (2) රැකියා අවස්ථා සුලභ වීම.
(3) දළ දේශීය නිෂ්පාදනයයි. (4) පෝෂ්‍යදායී ආහාර සුලභ කිරීමයි.

පාංශු ව්‍යුහය විනාශ වීමට බලපාන සාධක වන්නේ,
(1) නියමිත ගැඹුරට පස පෙරලීම. (2) ජල වහනය දුර්වල වීම.
(3) පසට කාබනික ද්‍රව්‍ය යෙදීම. (4) පාංශු පුනරුත්පාදන ක්‍රම යෙදවීම.

උච්චත්වය 300m සිට 900m අතර වන සහ වාර්ෂික වර්ෂාපතනය 2500m ට වැඩි කෘෂි දේශගුණික කලාපය හැඳින්වීමට යොදන සංකේතය නිවැරදිව දැක්වෙන පිළිතුරු තෝරන්න.
(1) WL ය (2) WU ය (3) lU ය (4) WM ය

කෘෂි ආර්ථිකය ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ කිනම් වර්ෂයකද?
(1) 1822 (2) 1912 (3) 1812 (4) 1960

• පස් අංශු වටා තදින් බැඳී ඇත.
• ශාක වලට ලබා ගැනීමේ හැකියාවක් නැත.

ඉහත ලක්ෂණ අනුව පාංශු ජලය වන්නේ,
(1) ජලාකර්ෂණ ජලය (2) ගුරුත්වාකර්ෂන ජලය
(3) කේෂාකර්ෂණ ජලය (4) භූගත ජලය

33. අධික වර්ෂාවකට පසුව පසට මහා අවකාශවලට පිරෙන ජලය ගුරුත්වාකර්ෂණය බලය යටතේ පසෙන් ඉවත්ව පහළට ගලා ගිය පසුව පසේ පවතින තෙතමන මට්ටම හැඳින්වෙන්නේ,
(1) සංතෘප්ත මට්ටම ලෙස.
(2) ක්ෂේත්‍රධාරිතාව ලෙස.
(3) තාවකාලික බැම්ම ලෙස.
(4) ස්ථර මැලවීම ලෙස.

34. අනිල මානය මගින් සුළඟේ වේගය මැනීම සිදුකරන අතර සුළඟ මනින ඒකකය කුමක්ද යැ තෝරන්න.
(1) තත්පරයට මීටර්
(2) පැයට මීටර්
(3) පැයට කිලෝමීටර්
(4) තත්පරයට කිලෝමීටර්

35. අනුරාධපුර හා පොළොන්නරු යන දිස්ත්‍රික්ක 2කට වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ කුමන වර්ෂාවකින්ද ?
(1) ඊසාන දිග මෝසම් වර්ෂාව මගිනි.
(2) නිරිති දිග මෝසම් වර්ෂාව මගිනි.
(3) සංවහන වර්ෂාව මගිනි.
(3) වායුජ වර්ෂාව මගිනි.

36. පසකට අධික ලෙස ජලය ලැබුණු විට එම පස ජලයෙන් සංතෘප්ත පසක් ලෙස හඳුන්වයි. තවත් එම පස බෝග වැඩීමට එතරම් හිතකර නොවීමට හේතුව වන්නේ,
(1) පාංශු වාතය නොමැති වීම.
(2) පාංශු උෂ්ණත්වය වැඩි වීම.
(3) ක්ෂුද්‍රජීවීන් ගේ ගහන වැඩි වීම.
(4) පාංශු ජලය ප්‍රමාණය වැඩි මට්ටමේ පැවතීම.

37. පාංශු ජීවීන්ගේ වැදගත්කමක් වන්නේ,
(1) කාබනික ද්‍රව්‍ය වියෝජනය කිරීම.
(2) ශාකවලට රෝග ඇති කරයි.
(3) ශාකවලට පළිබෝධ ලෙස ක්‍රියා කිරීම.
(4) පසේ නයිට්‍රිහරණය මගින් ශාක පෝෂක ඉවත්ව යාම.

38. මුහුදු මට්ටමේ සිට ඉහළට යන සෑම මීටර් 100 කටම යම් ප්‍රමාණයකට අඩු වීමක් සිදු වේ නම් එ අගය වන්නේ,
(1) 0.046 ^{0}C
(2) 0.46 ^{0}C
(3) 0.64 ^{0}C
(4) 0.84 ^{0}C

39. උපරිම අවම උෂ්ණත්වමානය මගින් නිශ්චිත කාල පරාසයක උෂ්ණත්වය මැනීමට බාවිත කරයි. මෙම උෂ්ණත්වමානයේ ද්‍රව ලෙසට භාවිතා කර ඇත්තේ,
(1) මධ්‍යසාර
(2) රසදිය
(3) මධ්‍යසාර හා රසදිය
(4) ඉහත කිසිවක් නොවේ.

40. බෝග වගාව කෙරෙහි උෂ්ණත්වය බලපාන අතර පරිසර උෂ්ණත්වය කෙරෙහි බලපාන සා වන්නේ,
අ. සමකයේ සිට ඇති දුර
ආ. වන ගහනය
ඇ. අභ්‍යන්තර ජලාශ තිබීම
ඈ. මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය

ඉහත ඒවායින් සත්‍ය වන්නේ,
(1) අ පමණි.
(2) ආ, ආ පමණි.
(3) අ, ආ, ඇ පමණි.
(4) අ, ආ, ඇ, ඈ පමණි.

PAST PAPERS WIKI
සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

Past Papers Wiki

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

81 | S | II

Grade 10 – First Term Test – July 2023

කාලය : පැය 2
Time: 2 hours

පළමු වාර පරීක්ෂණය - 2023 ජූලි - 10 ශ්‍රේණිය

කෘෂි හා ආහාර තාක්ෂණය - II

Class: -..... Index no: - .....

පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 04 ට පිළිතුරු සපයන්න.

අතීතයේ පටන් ශ්‍රී ලංකාවේ ගොවිතැන් කටයුතු සාර්ථකව සිදුකර පැවති අතර එමගින් ස්වයංපෝෂිත ආර්ථික රටාව පවත්වා ගැනීමට වාරිතාක්ෂණය ද උපකාරී විය. එමගින් කෘෂිකර්ම ක්ෂේත්‍රය බහුකාර්ය ක්‍රියාවලියක් බවට පත්වී ඇති අතර එය පසුකාලීනව කෘෂිකර්මාන්තය නමින් ප්‍රචලිත විය.

1. (i) ශ්‍රී ලංකාවේ අතීතයේ දී කෘෂිකර්මාන්තය පැවති බවට ඇති සාක්ෂි 2ක් ලියන්න.
(ii) කෘෂිකර්මාන්තයට අදාළ ප්‍රධාන අංග 2ක ලියන්න,
(iii) ස්වයංපෝෂිත බව ලඟාකර ගැනීමට දායකත්වය ලැබී ඇති අංග 2ක් සඳහන් කරන්න.
(iv) ස්වයංපෝෂිත ආර්ථික රටාවක් ඇති වීම කෙරෙහි අතීතයේ දී වාරි තාක්ෂණ බලපෑ අයුරු නිදසුන් 2 ක් මගින් පැහැදිලි කරන්න.
(v) පහත සඳහන් වැවක ඇතුළත් අංග වලින් ඉටුකෙරෙන කාර්යයක් බැගින් දක්වන්න.
1. රළපනාව
2. සොරොව්ව
(vi) 1. "මින්නේරි දෙවියන්" ලෙස දේවත්වයෙන් සලකනු ලබන රජු කවුද ?
2. එතුමා ඉදිකළ වැවක් නම් කරන්න.
(vii) බහු කාර්ය සංවර්ධන යෝජනා වල පොදු අරමුණු 2ක් ලියන්න.
(viii) විදේශ ආක්‍රමණ නිසා දේශීය කෘෂිකර්මාන්තයට සිදු වූ බලපෑම් 2ක් සඳහන් කරන්න.
(ix) නිදහස ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාව තුළ බිහිවූ බහු කාර්යය යෝජනා ක්‍රම 2ක් දක්වන්න.
(x) 1. හරිත විප්ලවය යනු කුමක්ද ?
2. හරිත විප්ලවය සමඟ කෘෂිකර්මාන්තයේ සිදු වූ වෙනස්කම් 2ක් ලියන්න.

2. යම් ප්‍රදේශයකට ගැලපෙන බෝග තෝරා ගැනීම හා අස්වනු වැඩිකර ගැනීම සඳහා එම ප්‍රදේශයේ දේශගුණය හා කාලගුණය පිළිබඳ දැනුම හා අවබෝධය තිබීම ඉතා වැදගත් වේ.
(i) a) කාලගුණික පරාමිති 02 ක දක්වන්න.
b) ඔබ ඉහත සඳහන් කළ පරාමියන් මැනීමට භාවිත කරන උපකරණ නම් කරන්න.
(ii) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා ඇති විභවයන් 2ක් සඳහන් කරන්න.
(iii) රටක දළ දේශීය නිෂ්පාදනයට දායක වන කෘෂිකාර්මික අංග 2 ක් දක්වන්න.

3. (i) මහා කන්නය සඳහා අයත් මාස නම් කරන්න.
(ii) එම කන්නය සඳහා වර්ෂාව ලැබෙන ප්‍රධාන වර්ෂා විධි නම් කරන්න.
(iii) ආහාර සුරක්ෂිතතාවය සඳහා බලපාන ප්‍රධාන සාධක 3ක් නම් කරන්න.

CamScanner

04. (i) ප්‍රභා අවධි සංවේදී ශාක යනු කුමක්ද යන්න හඳුන්වන්න.
(ii) a) ප්‍රභා අවධි සංවේදී ශාක වෙන්කර දක්වන ආකාර 2 නම් කරන්න.
b) ඉහත ආකාර 2ක සඳහා ඇති ශාක වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න.
(iii) දින උදාසීන ශාක ලෙස හඳුන්වන ශාක සඳහා නිදසුන් දක්වන්න.

05. (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප මුහුදු මට්ටමේ සිට ඇති උස අනුව වෙන්කර ඇති ඵ
කලාප 3 සඳහන් කරන්න.
(ii) ශ්‍රී ලංකාව බෙදා ඇති කෘෂි පාරිසරික කලාප ගණන කියද ?
(iii) කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ ඇති වැදගත්කම් 3ක් ලියන්න.

06. ශාකවලට අවශ්‍ය ජලය, පෝෂක සැපයීම මෙන්ම උපස්ථරයක් ලෙසද පාංශු ජීවීන්ගේ වාසස්ථානය
සැපයීම පස මගින් අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරයි.
(i) පාෂාණ වලින් පස නිර්මාණය වීමේ ක්‍රියාවලිය සරලව ලියා දක්වන්න.
(ii) පාෂාණ භෞතිකව ජීරණය වීමට බලපාන සාධක 2ක් ලියන්න.
(iii) a) පාංශු පැතිකඩ යනු කුමක්ද යන්න හඳුන්වන්න.
b) පාංශු පැතිකඩට අදාළ කොටස් සරලව ඇඳ නම් කරන්න.

07. සාර්ථක බෝග වගාවක් සඳහා පසේ ඇති සංඝටක හා පාංශු ලක්ෂණ කෙරෙහි ද වැඩි අවධානයක්
යොමු කිරීම වැදගත් වේ.
(i) පාංශු සංඝටක ඇති ප්‍රධාන ආකාර 4 නම් කරන්න.
(ii) පසේ භෞතික ලක්ෂණ ඇති ආකාර 4 නම් කරන්න.
(iii) a) පාංශු ප්‍රතික්‍රියා යනු කුමක්ද ?
b) පාංශු ප්‍රතික්‍රියා මැනීමට භාවිත වන පරිමාණය කුමක්ද ?

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner